**සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව - 2016**

----------------------------------------------------------------

සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ("බැංකුවේ ") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලයේ") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට **ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ** මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නීති හා රෙගුලාසි අවශ්‍යතාවයන්ගේ වාර්තාව

(අ) 2007 අංක 07 දරණ සමාගම් පණතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවය අනුව මා විසින් පහත දෑ ප්‍රකාශ කෙරේ.

(i) ඉහත පරිදි විගණකගේ මතයට පදනම හා විෂයපථය හා විගණන සීමාව.

(ii) මාගේ මතය

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගත් අතර උචිත ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබාගෙන ඇති බවට මාගේ වැඩිදුර පරීක්ෂාවෙන් පෙන්නුම් කෙරේ.

- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයට අනුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුකූලවේ.

(ආ) 1998 අංක 30 දරණ බැංකු පනතට හා එහි සංශෝධිතයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණය ගණනය සඳහා අනුමත ප්‍රතිපත්තියක් බැංකුව විසින් නියම කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

2007 අංක 12 දරණ බැංකු පනතේ 3 (2) වගන්තිය හා සංස්ථාපිත පාලනය සඳහා වූ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ මග පෙන්වීමට අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 7 කට නොඅඩු විය යුතුය. එසේ වුවත් 2016 වර්ෂයේදී සභාපතිවරයාද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 6 දෙනෙකු විය.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. මිලියන 258.7 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. මිලියන 192.7 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 66 ක් හෙවත් සියයට 34 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව බැංකුවේ පොලී ආදායම රු. මිලියන 75 කින් ඉහල යාම මෙකී ප්‍රතිඵලයෙහි වර්ධනයට මූලික වශයෙන් බලපා තිබුණි.

**3.2** **බැංකුවේ එකතු කළ අගය**

පසුගිය වර්ෂයේ එකතු කළ අගය වන රු. මිලියන 431 සමඟ සැසඳීමේදී ප්‍රවර්තන වර්ෂයේ එකතු කළ අගය පුද්ගල පඩිනඩි, බදු වියදම හා ක්ෂය වීම් වල එකතුව වන රු. මිලියන 229 ක් ගැලපීමෙන් පසු රු. මිලියන 488 ක් වී තිබුණි.

**3.3** **විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.3.1** **වැදගත් ගිණුම්කරණ අනුපාත**

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාල බැංකුවේ ඇතැම් වැදගත් ගිණුම්කරණ අනුපාත බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| දර්ශකය | අංශ අනුපාත (බලපත්‍රලාභී විශේෂිත බැංකු) | 2016 | 2015 |
|---|---|---|---|
| **ලාභදායීත්ව අනුපාත** | **සියයට** | **සියයට** | **සියයට** |
| ශුද්ධ ලාභ අනුපාතය | 9.30 | 35.22 | 28.85 |
| ශුද්ධ පොලී ආන්තිකය | 3.76 | 7.84 | 7.09 |
| පොලී ආදායමට ශුද්ධ පොලී ආදායම | 33.87 | 91.51 | 88.91 |
| මුළු ආදායමට පොලී නොවන ආදායම | 4.26 | 3.69 | 5.35 |
| පොලී ආදායමට පොලී පිරිවැය | 66.13 | 8.49 | 11.09 |
| මෙහෙයුම් වියදමට සේවක මණ්ඩල පිරිවැය | 51.14 | 52.12 | 54.94 |
| සාමාන්‍ය වත්කම් මත ඉපයීම | 1 | 3.03 | 2.36 |
| ස්කන්ධ මත ප්‍රතිලාභ | 18.3 | 5.30 | 4.07 |
| කොටසක ඉපයීම | - | 7.17 | 5.34 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය** | | | |
| (i) ස්තර i (Tier i) | 13.5 | 75.52 | 69.34 |
| (ii) ස්තර ii (Tier ii) | 15.2 | 76.25 | 69.90 |
| **ද්‍රවශීලතා අනුපාත** | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවමය සියයට 20) | 61.4 | 1053.37 | 888.18 |
| **වත්කම් ගුණත්වය** | | | |
| අක්‍රිය අත්තිකාරම් අනුපාතය | 5.28 | 39.2 | 35.2 |

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමාන්‍ය බලපත්‍රලාභී විශේෂිත බැංකුවල පොලී ආන්තිකය සියයට 3.76 හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 9.3 සමග සැසඳීමේදී බැංකුවේ එය පිළිවෙලින් සියයට 7.84 ක් හා 35.22 ක ඉහළ අගයක් වී තිබුණි.

(ආ) පොලී ආදායම් මත පොලී වියදම් අනුපාතය සියයට 8.49 ක් වූ අතර එය සාමාන්‍ය බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අගය වූ සියයට 66.13 ට වඩා අඩු අගයක් විය.

(ඇ) බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 76.25 ක් වන අතර එය අවම අවශ්‍යතාවය වූ සියයට 10 ක ප්‍රමාණයට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ද්‍රවශීලතා වත්කම් අනුපාතය අවම අවශ්‍යතාවය වූ සියයට 20 ට සාපේක්ෂව සියයට 1053.37 ක් දක්වා තවදුරටත් වර්ධනය වී තිබුණි.

(ඉ) බැංකුව සියයට එකක ආංශික අනුපාතය අභිබවා සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 3.03 ක අගයක් වාර්තා කර තිබුණි. කෙසේවුවත් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය ආංශික අනුපාතයට වඩා පසුපසින් පැවතුනි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට අක්‍රිය ණය අනුපාතය සියයට 39.2 ක ඉහළ අගයක් පැවති අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකුවල සාමාන්‍ය අගය වූ සියයට 5.28 ට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

**3.3.2** **බැංකුවේ ද්‍රවශීල පරතරය**

**--------------------------**

2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් විශ්ලේෂණයේදී, වත්කම් හා වගකීම් වල පරිනතවීම් කාලයෙහි නොගැලපීම හේතුවෙන් වර්ෂ 5 ට වැඩි මුළු වගකීම් මුළු වත්කම් වලට වඩා අධික බව අනාවරණය විය.

| | **මාස 3 දක්වා** රු. | **මාස 3-12 දක්වා** රු. | **අවුරුදු 1-3 දක්වා** රු. | **අවුරුදු 3-5 දක්වා** රු. | **අවුරුදු 5ට වැඩි** රු. |
|---|---|---|---|---|---|
| වත්කම් | 1,667,411,700 | 4,570,961,357 | 1,032,845,349 | 878,186,206 | 522,489,334 |
| වගකීම් | 157,559,403 | 80,218,392 | 28,155,941 | 17,757,285 | 8,388,202,925 |
| වෙනස | 1,509,852,297 | 4,490,742,965 | 1,004,689,408 | 860,428,921 | (7,865,713,591) |

**4.** **මෙහෙයුම් කටයුතු**

**--------------------**

**4.1** **කාර්යසාධනය**

**----------------**

**(අ)** **මූලික පරමාර්ථ ඉටුකර ගැනීම**

**---------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**i) 2016 වර්ෂයේ පිළියෙල කරන ලද ව්‍යාපාර සැලැස්මෙහි දැක්වෙන පරිදි සමාලෝචිත වර්ෂයේ දී බැංකුව විසින් ලබා කරගත් සාරාංශ ගත ඉලක්ක පහත දැක්වේ.**

| ඉලක්ක | සත්‍ය කාර්යසාධනය |
| --- | --- |
| බැංකු ශාඛා ජාලය හරහා තැන්පත් ප්‍රමාණය රු. මිලියන 1,000 කින් වැඩිකිරීම | පෙර වර්ෂය හා සැසඳීමේදී තැන්පතු ප්‍රමාණය රු. මිලියන 99.5 කින් අඩුවී තිබුණි. |
| සියළුම ශාඛා වල සමතුලිතතා ලක්ෂ්‍යය ලඟා කර ගැනීම | සමාලෝචිත වර්ෂයේ දී බැංකුවේ අලාභ ලබන ශාඛා හයක් පැවති අතර ලාභ ලබන ශාඛා පැවතියේ දෙකක් පමණි. |
| බැංකුවේ ණය කළඹ රු. මිලියන 1,500 කින් පුළුල් කිරීම | පෙර වර්ෂය අවසානය හා සැසඳීමේදී ණය හා අත්තිකාරම් රු. මිලියන 341.7 කින් පමණක් වර්ධනය වී තිබුණි. |
| වර්ෂය අවසානයේදී අක්‍රිය අත්තිකාරම් ශේෂය සියයට 25 හෙවත් රු. මිලියන 1,200 කින් අඩුකිරීම | පෙර වර්ෂය අවසානය හා සැසඳීමේදී අක්‍රිය අත්තිකාරම් සියයට 39.2 කින් හෙවත් රු. මිලියන 1,467 කින් වැඩි වී තිබුණි. |
| අනාගත කාර්යමණ්ඩල බඳවා ගැනීම සඳහා සේවක හැකියාව වර්ධනය | මූලික කළමණාකරණ තනතුරු වල හැකියාව ඇති නිලධාරීන්ගේ අඩුව හා බඳවා ගැනීම් වල හා උසස් කිරීම් වල විෂමතා නිරීක්ෂණය විය. |
| IFRS හා නව වාර්තා කිරීම් අවශ්‍යතාවය ලඟා කර ගැනීම සඳහා අන්තර් බැංකු පරිගනක පද්ධතිය සංවර්ධනය කිරීම | අවශ්‍ය තොරතුරු සීඝ්‍රයෙන් සැපයීම සඳහා පවතින බැංකු පද්ධතිය ප්‍රමාණවත් නැත. |

**ii)** 2012 – 2016 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම සහ එහි ප්‍රගතියට අනුව සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීම සාරාංශ කර පහත දැක්වේ.

| අයිතම | ඉලක්ක | සත්‍ය | විචලනය (හිතකර / අහිතකර) |
| --- | --- | --- | --- |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පොලී ආදායම | 987.8 | 707.3 | (280.5) |
| පොලී වියදම | 376 | 60 | 316 |
| පොලී නොවන ආදායම | 6.75 | 27 | 20.25 |
| බදු පෙර ලාභය | 300.85 | 258.7 | (42.15) |
| ණය හා අත්තිකාරම් | 9,000 | 3,675.7 | (5,324.3) |
| තැන්පතු | 4,820 | 420.9 | (4,399.1) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

i) පොලී ආදායම, බදු පෙර ලාභය, ණය හා අත්තිකාරම් හා තැන්පතු යන ප්‍රධාන ව්‍යාපාර කටයුතු වලට අදාලව සංයුක්ත සැලැස්මේ දක්වා තිබුණු ඉලක්කයන් ලඟාකර ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි.

ii) ඉලක්කයන් හා සැසඳීමේදී තැන්පතු හා ණය හා අත්තිකාරම් වලට අදාලව ඉලක්ක ලඟා කර ගැනීම ඉතා පහළ මට්ටමක පැවතුණි.

iii) බැංකුව විසින් සැලැස්මට අනුව ඉලක්ක ලඟා කර ගැනීම කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.

iv) කෙසේවෙතත් පවත්නා සංයුක්ත සැලැස්ම ඵලදායී නොවන බැවින්, නව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට බැංකුව විසින් සැලසුම් කර තිබුණි.

(ආ) ණය පරිපාලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) ණය වෙන්කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2016 වර්ෂයේදී බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය රු. මිලියන 1,289 ක් වූ අතර එම ණය වලින් 2017 මැයි 31 දිනට හිඟ ශේෂය රු.මිලියන 928 කි. මෙම ණය වලින් රු.මිලියන 236 ක් හෙවත් සියයට 25 ක් අක්‍රිය ණය ගණයට අයත්වේ.

- බැංකුවේ ණය අත්පොතෙහි ප්‍රතිපාදන වලට විරුද්ධව 2016 ජනවාරි 01 සිට 2017 මැයි 31 දක්වා කාලය තුල බැංකුව විසින් ඒකපුද්ගල ණය ගැනුම් සීමාව වූ රු. මිලියන 20 ඉක්මවා ගණුදෙනු කරුවන් 9 දෙනෙකු හට රු. මිලියන 697 ක සමස්ථ ණය ප්‍රමාණයක් ප්‍රදානය කර තිබුණි. මෙම ණය වලින් 2017 මැයි 31 දිනට රු. මිලියන 482 ක් හිඟ ණය වේ.

- සමාලෝචිත වර්ෂයේ දී බැංකුවේ වෙන්නප්පුව ශාඛාව විසින් වී තොග උකස් මත රු. මිලියන 65 ක් වූ කෙටිකාලීන ණය පහසුකම් 9 ක් පිරිනමා තිබුණි. මෙම ණය වලින් 2017 මැයි 31 දක්වා එක් වාරිකයක්වත් අයකර ගෙන නොතිබුණි. අභ්‍යන්තර විගණනයේ නිරීක්ෂණයන් අනුව, වී ගබඩා හතක අගුලු කඩා තිබුණ බව අනාවරණය විය. තවද ණය පහසුකම් තුනකට අදාලව උකසට තැබූ වී තොග වලට වඩා පවතින වී තොග අඩු අතර තවත් වී ගබඩා තුනක තොග නොතිබුණි.

ii) අක්‍රිය ණය හා අත්තිකාරම්

2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය හා අත්තිකාරම් රු. මිලියන 3,675.7 ක් වූ අතර එයින් රු. මිලියන 1,467 ක් හෙවත් සියයට 39.9 ක් අක්‍රිය ණය ලෙස වර්ග කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට අක්‍රිය ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය | |
|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | ප්‍රතිශතය |
| විශේෂ සඳහන් කිරීම් | 280 | 19 |
| අපේක්ෂිත මට්ටමට නැති | 138 | 9 |
| සැකසහිත | 130 | 9 |
| අලාභ | 919 | 63 |
| මුළු | 1,467 | 100 |

2017 මැයි 31 දිනට රු. 516,560,452 ක හිඟ අක්‍රිය ණය වලින් එක් වාරිකයක්වත් අයකර ගත නොහැකිවී තිබුණි.

iii) මෙහෙයුම් කාර්යසාධනය

ප්‍රධාන මෙහෙයුම් කටයුතු සඳහා අඩු අවධානයක් යොමු කර ඇති බව පෙන්නුම් කරමින් 2016 වර්ෂයේ ඉපයූ මුළු පොලී ආදායම වූ රු. මිලියන 707 න් ණය හා අත්තිකාරම් ලබා දීම මඟින් ඉපයූ පොලී ආදායම සියයට 48 ක් හෙවත් රු. මිලියන 339 ක් පමනක් වී තිබුණි. එම නිසා බැංකුවේ අතිරික්ත අරමුදල් අනෙකුත් මූලාශ්‍ර වල ආයෝජනය කිරීම තුලින් රු. මිලියන 368 ක පොලී ආදායමක් ඉපයීමට නොහැකි වුනිනම් බැංකුව රු. මිලියන 109 ක මෙහෙයුම් අලාභයක් ලැබීමට හැකියාව තිබුණි.

(ඇ) තැන්පතු

----------

පෙර වර්ෂය හා සැසඳීමේදී බැංකුවේ තැන්පත් ප්‍රමාණය 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 520 සිට 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 420.8 ක් දක්වා සියයට 19 කින් අඩුවී තිබුණි.

(ඈ) වෙළඳපොල කොටස

-----------------------

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 කට අදාලව බැංකු පද්ධතිය හා වරලත් විශේෂිත බැංකු පද්ධතිය සමග සැසඳීමේදී ණය හා අත්තිකාරම් හා තැන්පතු මත බැංකුවේ වෙළඳපොල කොටස පහත දැක්වේ.

| වර්ෂය | බැංකු පද්ධතියේ ප්‍රතිශතයක් ලෙස | | වරලත් විශේෂිත බැංකු පද්ධතියේ ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|
| | ණය හා අත්තිකාරම් මත | තැන්පතු මත | ණය හා අත්තිකාරම් මත | තැන්පතු මත |
| 2016 | 0.07 | 0.01 | 0.69 | 0.05 |
| 2015 | 0.07 | 0.01 | 0.73 | 0.07 |
| 2014 | 0.07 | 0.01 | 0.62 | 0.05 |
| 2013 | 0.07 | 0.01 | 0.70 | 0.04 |
| 2012 | 0.08 | 0.01 | 0.78 | 0.04 |

අවුරුදු 5 කාලසීමාව පුරාම බැංකුවේ සමස්ථ වෙළඳපොල කොටස සියයට 1 ට අඩුවුණි.

4.2 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු. 2,798,093 ක හඳුනා නොගත් තැන්පතු හඳුනාගැනීමට සහ නිවැරදි කිරීමට බැංකුව කටයුතු කර නොතිබුනි.

(ආ) පෙර වර්ෂවලදී මාගේ විගණන වාර්තා වල වාර්තා කරන ලද අඩුපාඩු සමාලෝචිත වර්ෂයේදී ද නැවත සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව බැංකුව විසින් සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ, සහකාර සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පරිපාලන ලෙස පත්කර තිබුණි.

**4.3 මෙහෙයුම් දුර්වලතා**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්සත් ධීවර උදාන සකසුරුවම් හා ණය සමූපකාර සමිතිය වෙත ලබා දී තිබූ රු. මිලියන 5 ක ණය අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩුවට අදාලව, ලිපිලේඛණ වල අඩුපාඩු හා මෙවැනි ණය ප්‍රදානයේදී බැංකුව අනුගමනය කර තිබූ වැරදි පිළිවෙත මත බස්නාහිර පළාත් මහාධිකරණය විසින් බැංකුවට එරෙහිව තීන්දුව දී තිබුණි.

(ආ) රෝහල් නේවාසිකාගාර ඇතිකිරීමේ පරමාර්ථයෙන් බදු දුන් හම්බන්තොට ශාඛාවට අයත් ගොඩනැගිලි කොටස සඳහා බැංකුව හා හම්බන්තොට දිස්ත්‍රික් මූලික රෝහල අතර ඇතිකරගත් බදු ගිවිසුම 2015 ජූලි 16 දින අවසන් වන අතර 2017 මැයි 31 දින වන විටත් අළුත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**4.4 බැංකුව විසින් ආරම්භකළ හා බැංකුවට විරුද්ධ නීති පටිපාටි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 මැයි 01 දින දක්වා බැංකුව විසින් නඩුපවරා ඇති නීති ගොනු එකසිය පනස් තුනෙන් නඩු 19 කට පමණක් තීරණ දී තිබුණු අතර එයින් තීරණ තුනක් බැංකුවට අවාසිදායක වී තිබුණි. රීට් ආඥා නිලධාරියකු නොමැතිකම නිසා ණය පැහැර හරින ලද ගණුදෙනුකරුවන්ට විරුද්ධව රීට් ආඥා ගෙන නොතිබුණි. ඒ අතර තුර ගණුදෙනුකරුවන් සමඟ උසාවියේදී ඇතිකරගත් බේරුම් කිරීම් පරිදි හිඟ ණය අයකර ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි.

(ii) 2017 මැයි 1 දිනට පරාටේ අයිතිය ක්‍රියාත්මක කිරීමට එරෙහිව ණය ගැනුම්කරුවන් විසින් බැංකුවට විරුද්ධව නඩු දහයක් පවරා තිබූ අතර සේවකයන් විසින් නඩු පහක් පවරා තිබුණි.

**4.5 මානව සම්පත් කළමණාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යාව 181 ක් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමෙන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. කෙසේවෙතත් අනුමත සේවක සංඛ්‍යාව නැවත සමාලෝචනය කර සංශෝධනය කරන ලද සේවක සංඛ්‍යාව සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලබා ගන්නා ලෙස භාණ්ඩාගාරයේ ලේකම් විසින් 2013 අගෝස්තු 13 දින උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත් එවැනි සමාලෝචනයක් සිදු නොකර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත බැංකුව 2016 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 191 ක් දක්වා වැඩිකර තිබුණි.

(ආ) උසස් වීම්

i) 2015 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණයට අනුව, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (සමස්ථ බැංකු සුපරීක්ෂණය) තනතුර සඳහා බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලයේ එවැනි තනතුරක් නොතිබුණ ද බැංකුව විසින් නිලධාරියකු උසස් කර තිබුණි.

ii) 2015 සැප්තැම්බර් 15 දිනැති අංක එච්ආර්/15/685 දරණ අභ්‍යන්තර මැමය මත ජ්‍යෙෂ්ඨ කළමනාකරු තනතුරට උසස් වීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් 4 දෙනෙකු ඉල්ලුම්පත් එවා තිබුණි. 2015 ඔක්තෝබර් 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණයට අනුව, සම්මුඛ පරීක්ෂණයේදී පළමු තැන ගත් නිලධාරියා නොසලකා දෙවන හා තුන්වන තැන ගත් නිලධාරීන් ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් ලෙස උසස් කිරීමට අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී තිබුණි. කෙසේ වෙතත් 2017 මාර්තු 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණයට අනුව ඉහළම ලකුණු ලබාගත් නිලධාරියා 2015 නොවැම්බර් 01 දින සිට ජ්‍යෙෂ්ඨ කළමණාකරු ලෙස උසස් කර තිබුණි.

(ඇ) බඳවා ගැනීම්
පුහුණුවන බැංකු සහකාර, පුහුණුවන ව්‍යාපාර සංවර්ධන සහකාර, බැංකු සහකාර හා කළමනාකරණ පුහුණුවන්නන් යන තනතුරු සඳහා 2015/2016 කාලපරිච්ඡේදය තුල බඳවා ගැනීම් සම්බන්ධයෙන් පහත දෑ නිරීක්ෂණය විය.

i) මෙම බඳවා ගැනීම් වල අවශ්‍යතාවය විගණනයට ඉදිරිපත්වී නොතිබුණි.

ii) පෞද්ගලික ලිපිගොනු විගණන පරික්ෂාවේදී, 2007 අංක 12 දරණ බැංකු පනතට අනුව සභාපතිට හැකියාවක් නොමැති වුවත් ඉහත තනතුරු සඳහා ඉල්ලුම්පත් නිර්දේශ කිරීම සභාපති විසින් සිදුකර තිබුණු අතර පත්වීම් ලිපිද එවකට සිටි සභාපති විසින් අත්සන් කර තිබුණු බව නිරීක්ෂණය විය.

iii) බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව අනුව, පුහුණු වන බැංකු සහකාරවරු, බැංකු සහකාරවරු හා සංවර්ධන සහකාරවරු 73 දෙනෙකු විය. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 96 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාව 23 කින් ඉක්මවීමකි.

(ඇ) අ.පො.ස.(සා/පෙළ) ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් වලට සාමාන්‍ය සාමාර්ථ ලබා ගෙන තිබූ අයදුම්කරුවන් දෙදෙනෙකු බැංකු සහකාර තනතුර සඳහා බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් ඔවුන් විසින් අධ්‍යාපන සුදුසුකම් වලට අතිරේකයක් ලෙස ඩිප්ලෝමා සහතික දෙකක් ලබා දී තිබුණි. ඩිප්ලෝමා සහතික ප්‍රදානය කළ අධ්‍යාපන ආයතනයන් ප්‍රදානය කරන ලද ඩිප්ලෝමා සහතික වලට අදාල පහත සඳහන් අඩුපාඩු විගණනයේදී අනාවරණය විය.

i) ඉහත අධ්‍යාපන ආයතනයේ හිටපු කළමනාකරණ අධ්‍යක්ෂ එවකට බැංකුවේ සභාපති විය.
ii) ඉහත ආයතනය වෘත්තීය පුහුණු කොමිසම යටතේ ලියාපදිංචි වී තිබුණද ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීමට ඉඩදී නොතිබුණි.

(ඉ) අවම වයස් අවශ්‍යතාවය හා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණද බැංකුවේ එවකට සිටි සභාපතිගේ නිර්දේශය මත නිලධාරීන් දහසය දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද 2017 මැයි 31 දින අවශ්‍ය සුදුසුකම් ගැන සැලකීමක් නොදක්වා බැංකුව විසින් සේවකයින් හත් දෙනෙකුගේ සේවය ස්ථිර කර තිබුණි.

(ඊ) පුහුණුවන කළමනාකරණ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණ පුද්ගලයෙකු බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් ඉහත සේවකයාට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර සේවකයාගේ ඉල්ලීම සලකා බැලීමෙන් පසු පුහුණුවන බැංකු සහකාර ලෙස පත්කර තිබුණි.

(උ) අවශ්‍ය සුදුසුකම් සපුරන ලද පුද්ගලයින් විසි දෙනෙකු 2015/2016 වර්ෂය තුලදී කළමනාකරු, පුහුණුවන බැංකු සහකාර, පුහුණුවන බැංකු සංවර්ධන සහකාර, රියදුරු හා කාර්යාල සහකාර ලෙස බඳවාගෙන තිබුණි. එසේ නමුත් 2017 ජූනි 30 දින දක්වා ඔවුන් ස්ථිර කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් බැංකුව විසින් ගෙන නොතිබුණි.

### 4.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල රු. 21,684,018 ක විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සලසා තිබුණි. එසේ වුවත් අනාගතයේදී වගකීම් නිදහස් කිරීමේදී ඇතිවන ද්‍රවශීලතා ගැටළු නිරාකරණය කර ගැනීම පිණිස එම අගය බැංකුව විසින් ආයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 5 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

අනුමත සේවක සංඛ්‍යාව 5 ක් වුවත් අභ්‍යන්තර විගණන අංශය තුල නිලධාරීන් හතර දෙනෙකු කාර්යයන්හි යොදවා තිබුණි. එසේ වුවත් ඔවුන් විසින් බැංකුවේ ශාඛා 8 ක් හා ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු විගණනය කළයුතුවේ.

## 5.2 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය අයිතමයන් අතර සියයට 72ක් දක්වා සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණු බව පෙන්නුම් කෙරුණි.

## 6 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කෙරුණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ අනුව හානිකරණ ප්‍රතිපාදන සහ විශේෂ ප්‍රතිපාදන ගණනය කිරීම |
| (ආ) ණය පරිපාලනය | - හඳුන්වා දී ඇති ක්‍රියා පිළිවෙත්වලට දැඩිව අනුකූල වීම<br>- ණය ඇගයුම් පටිපාටියේ පවතින අඩුපාඩු<br>- පවතින ඉහළ අක්‍රීය ණය අනුපාතය<br>- උකස් තැබූ දේපල වල නිවැරදිතාවය සහතික කර ගැනීම<br>- බේරුම් නොකරන ලද ණය මත නීතිමය පියවර ගැනීම |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | - බඳවාගැනීම හා උසස්කිරීම් පටිපාටියට අදාල රෙගුලාසි පිළිපැදීම<br>- අදාල තනතුරු සඳහා සුදුසුකම් ඇති කාර්යමණ්ඩලයක් බඳවාගැනීම<br>- කාර්යමණ්ඩලයට සුදුසු පුහුණුවීම් ලබාදීම |
| (ඈ) සංස්ථාපිත පාලනය | - සංස්ථාපිත පාලනයේ මගපෙන්වීම් වලට අනුකූල වීම<br>- ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති මගපෙන්වීම් හා උපදෙස්වලට අනුකූල වීම. |